# කාමරාගානුසය හා පටිඝානුසය පිළිබඳ බෞද්ධ අර්ථකථනය

ජී. ඒ. ගාමිණී රත්න ශ්‍රී[1]

ථේරවාද සම්ප්‍රදායයෙහි බුද්ධ දේශනාවල අනුසය (එවම්පි තණ්හානුසයෝ අනුහතෝ) නමින් කිසියම් සුවිශේෂී ශක්ති විශේෂයක් පවතී. ඒ වූ කලී පාපී ද නොවන අකුසල ද නොවේ. ඒ වනාහි නිර්වාණ ප්‍රතිපදා මාර්ගයට පූර්ණ වශයෙන් බාධා පමුණුවන ශක්තියෙකි. එකී ශක්තියට ප්‍රමාණවත් පෝෂණය ලදහොත් කෙලෙස් වශයෙන් අභිවර්ධනයට පත්වෙයි. උපන් සැණෙකින් ළදරුවකුගේ මුවෙහි දත් නොමැත්තා සේ ද පිරිමි දරුවකුගේ ද එකෙණෙහි මුහුණෙහි රැවුල නොමැත්තේ ය. සාමාන්‍ය ස්වභාවය ඒසේ වුවත් ඒවා ජනිත වීමේ ජනක ශක්තිය එකී සිරුරුවල නිසැකයෙන් මැ පවතී.

පෙර කී සේ අනුසය නමින් හඳුන්වා ඇති ශක්ති විශේෂ නිවණට බාධා පමුණුවන නමුදු පූර්ණ වශයෙන් නිවන් අහුරාලන සංයෝජන ගණයට නොවැටේ. එසේ වුව ද අනුසය ගණයට අන්තර් ග්‍රහණය වන ධර්මතා සප්තකයක් සූත්‍රධර්මයන්හි විද්‍යාමන වේ. ඒ මෙසේ යි. කාමරාගානුසය, පටිඝානුසය, දිට්ඨි අනුසය, විචිකිච්ඡා අනුසය, මානානුසය, භවරාග අනුසය, අවිජ්ජානුසය යනු ඒ පස යි. මේ වූ කලී කාම -කෝප වැනි ගොරෝසු කර්කශ තත්ත්වයකට දියුණු නො වූ මූලික සංවර්ධනීය අවස්ථා බව සිහි කටයුතුයි. මෙහි මූලික වශයෙන් ප්‍රකට වන්නේ කාම - කෝප ආදිය පූර්ණ වශයෙන් ජනිත කරලීමට පවත්නා මූලබීජ පමණි. අතිශයින් සූක්ෂ්ම නිද්‍රා අවස්ථාවෙක පවත්නා නිසාවෙන් උත්තුංග ගුණයක් මනසෙහි සුප්‍රතිෂ්ඨාපනයට මෙයින් කිසිදු බාධාවෙක් නොමැත. ඒ මන්ද යත් ? නිර්වාණාධිගමයට නොපැමිණි සියල්ලන් වෙතැ මෙකී තත්ත්වය පවත්නා නිසාවෙනි.

මෙකී අනුසය ධර්ම සප්තකයෙන් දිට්ඨි හා විචිකිච්ඡා යන දෙක සහමුලින් ම අවසන් වන්නේ සෝවාන් ඵලයෙනි කාමරාග හා පටිඝ යන අනුසය ද්වය සහමුලින් ම අවසන්වන්නේ අනාගාමී ඵලයෙනි. එසේ වුවත් සෙසු අනුසය තුන වූ භවරාග, මාන හා අවිජ්ජා සහමුලින් ම ප්‍රහීණ වන්නේ අරහත් ඵලයෙනි. මැදුම් සඟියේ චූලමාලුංක්‍ය සූත්‍රයේ දී බුදුරදහු අනුසය ධර්මයන්ගේ ප්‍රවර්තනය පිළිබඳ ව ප්‍රකාශ කොට ඇත්තේ මෙසේ යි. චූලමාලුංක්‍ය පුත්තය උටුකුරුව නිදන (මුනින් අත පෙරලීමට පෙර) කුඩා ම ළදරුවකුට කාමාශාව කියා දෙයක් ප්‍රකට නොවේ ම ය. කාම වස්තූන් පිළිබඳව ඇල්මක් හෝ ගැල්මක් එවන් කෙනෙකුට කෙසේ නම් මතුවේ ද? ඔවුහු වෙත පවත්නේ කාම රාග අනුසය පමණි. එබඳු වූ නොදරුවෙකුට සත්ත්වයෝ යන සඤ්ඤාව ද නිවැරදිව නොපවතී. එසේ හෙයින් සත්ත්වයින් උදෙසා ව්‍යාපාදයෙක් ජනිත වන්නේ කෙසේ ද? එවැන්නේකු තුළ රඳන්නේ හුදෙක් ම අනුසයක් මැ පමණි.

පූර්වෝක්ත විග්‍රහයට අනුරූපව විමසා බලත් ම හැඟෙනුයේ අනුසය වනාහී ක්ලේශ ධර්මයන්ගේ සූක්ෂම නිද්‍රා අවස්ථාවක් බවයි. එසේ මැ ඒවාට ඉන්ධන ලැබීම නිසා මුහුකුරා යාමෙන් ගොරෝසු කෙළෙස් දහම් උත්පාදනය වන බවත් ය. මෙම සූතුරේ දී බුදුරදුන් අවසන් වශයෙන් නිගමනය කොට පවසන්නේ මාර්ග සිත්වලින් එකී කෙළෙස් දහම් පූර්ණ වශයෙන් බැහැර වන්නේ අනුසය සහිත බවත්, එය නිසැකයෙන් මැ පහ වූ කල්හි නැවත හට ගැනීමක් කිසිදා කවර අයුරෙකින් වත් සිදු නොවන බවත් ය.

**ප්‍රමුඛ පද:** කාමරාගානුසය, පටිඝානුසය, ක්ලේශ ධර්ම, අනුසය, අකුසල

---

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය